## පාදක සටහන්


1. Responsibility in Mass Communication. Willam L. Rivers, Wibur Schramm 1969, P. 29.
2. The World news Prism, Hachten Willam A, 1987 P. 15
3. Responsibility in Mass Communication P. 35 - 40
4. ලෙනින් වී. අයි. - සම්පූර්ණ කෘති එකතුව 41 වෙළුම, 99 පිට (රුසියානු බසින්)
5. සන්නිවේදන මූලධර්ම - ප්‍රොහරොව් ඊ. පී. 1988, 5 පිට (රුසියානු බසින්)
6. Mass Communication Theory, An Introduction, Denis Mcquail - 1984 P 92 U. S. A.
7. ලෙනින් වී. අයි. - සම්පූර්ණ කෘති එකතුව 41 වෙළුම, 102 පිට.
8. විමර්ශී - සාර සංග්‍රහය - කොළඹ විශ්වවිද්‍යාලය (මහාචාර්ය සුචරිත ගම්ලත් ලිපිය) 1991 - 30 පිට.


# සමාජ විඥානය හා ජනසන්නිවේදනය සම්බන්ධ දාර්ශනික ගැටලු කීපයක්

ශාස්ත්‍රපති එල්. විජයධර් වීරසිංහ

විඥානය ද්‍රව්‍යයේ දීර්ඝකාලීන මෙන්ම සංකීර්ණ වර්ධනයේ ප්‍රතිඵලයක් වන අතර, මිනිස් විඥානය ඩුකලී ද්‍රව්‍යයේ සමාජීය ස්වරූපයෙහි ප්‍රගමනයේ ප්‍රතිඵලයකි. මිනිස් විඥානය මූලික වශයෙන් සමාජීය වන අතර පෞද්ගලික ද වේ. ඒක පුද්ගල විඥානය ස්ව විඥානය වන අතර සමාජ විඥානය ජන විඥානය වශයෙන් ඉදිරිපත් වේ. මේ අනුව පොදුවේ විඥානය පැවැත්මේ ප්‍රධාන ආකාර දෙකක් වේ. එනම් එක් පුද්ගලයෙකු සම්බන්ධයෙන් ස්වවිඥානය වශයෙනුත්, සමාජය වශයෙන් ජන විඥානය වශයෙනුත් වේ. සමාජ විඥානය හෙවත් ජන විඥානය මිනිසුන්ගේ ඓතිහාසික, සමාජ ආර්ථික හා සංස්කෘතික ක්‍රියාකාරිත්වයේ ප්‍රතිඵලයකි. ස්වවිඥානයෙන් තොර සමාජ විඥානය පිළිබඳවත්, සමාජ විඥානයෙන් තොර ස්වවිඥානය පිළිබඳවත් අපට සිතිය නොහැකිය.

ස්වවිඥානය පුද්ගලයා ලෝකයට තිබෙන සම්බන්ධතාව ප්‍රකාශ කරන්නක් වන අතර ඔහු අවට පරිසරයේ සිදුවන සිද්ධීන් හා ක්‍රියාදමයන් පරාවර්තනය කරගන්නා ආකාරය හා ඒවා ඔහු විසින් අගය කෙරෙන ආකාරය වන අතර, සමාජ විඥානය සමාජයේ පවත්නා අදහස්, න්‍යායන්, ආකල්ප, දෘෂ්ටීන් හා සම්ප්‍රදයයන්ගේ සමස්තය නියෝජනය කරයි.

ජන විඥානයේ හෙවත් සමාජ විඥානයේ විවිධ ස්වරූප ඓතිහාසික වශයෙන් හැඩ ගැසී වර්ධනය වී ඇති අතර, ප්‍රධාන ස්වරූපය වශයෙන් මිථ්‍යාවන්, ආගම, දර්ශනය, කලාව, දේශපාලනය, සදාචාරය, ආචාර ධර්ම, විද්‍යාව හා සම්ප්‍රදයයන් ආදිය ඉදිරිපත් වේ. මේ සමාජ විඥානයේ සියලු ස්වරූප වෙන්කළ නොහැකි ලෙස ඒකත්වයක පවතී.

න්‍යායික විඥනය සහ සාමාන්‍ය විඥනය වශයෙන් සමාජ විඥනයේ ප්‍රධාන මට්ටම් දෙකක් ද දක්නට ලැබේ.

අප මේ ඉහතින් සඳහන් කරන ලද මිනිස් විඥනයේ, සමාජ විඥනයේ සියලු ආකාර, ස්වරූප හා මට්ටම් ආදිය පැවැතිමට එක් මූලික කොන්දේසියක් අත්‍යවශ්‍ය වේ.

මෙම මූලික කොන්දේසිය නම් ජනසන්නිවේදනයයි. සන්නිවේදනයෙන්, ජනසන්නිවේදනයෙන් තොරව මිනිස් විඥනයට සමාජීය වශයෙන් හෝ පුද්ගලික වශයෙන් හෝ පැවැතිය හෝ ක්‍රියාත්මක විය හෝ නොහැකිය. මිනිස් විඥනය යනු මිනිසුන් අතර සිදුවන අන්තර් ක්‍රියාකාරිත්වයේ ප්‍රතිඵලයකි. මිනිස් ක්‍රියාකාරිත්වය සන්නිවේදනය ජනිත කරයි.

මිනිස් විඥනය මූලික වශයෙන්ම සන්නිවේදනාත්මකය. සන්නිවේදනය වූකලි අවම වශයෙන් විඥන දෙකක් අතර සිදුවන අන්තර් සම්බන්ධතාව වේ. මෙම අන්තර් සම්බන්ධතාවෙහි ස්වරූප හා ආකාර සමාජ, ආර්ථික, හා විද්‍යාත්මක, තාක්ෂණික වර්ධනයත් සමඟම නිරන්තරයෙන් වෙනස් වේ. මෙය මිනිස් සමාජය ආරම්භයේදී ස්වභාවික හා ඍජු ස්වභාවයක් ගත්තේය. ආරම්භයේදී මිනිසුන් අතර සන්නිවේදනය බිහිවූයේ එය ඔවුන්ගේ ක්‍රියාකාරිත්වය සඳහා විෂය මූලික අවශ්‍යතාවක් වූ බැවිනි. එකිනෙකාට මොනවදෝ කීමේ අවශ්‍යතාවක් මතුවිය.[1]

මිනිස් විඥනය ස්වභාවයෙන්ම සන්නිවේදනාත්මකය. සන්නිවේදනය මිනිස් විඥනයේ ව්‍යුහය සකසයි. මේ අනුව සන්නිවේදනය මිනිස් විඥනයේ ගුරුවරයා වශයෙන් ක්‍රියා කරයි. ගුරුවරයා කෙසේද ගෝලයාද එසේය.

වර්තමානයේ විද්‍යාවේ හා තාක්ෂණයේ ප්‍රගතිය හේතු කොට ගෙන ජනසන්නිවේදන මාධ්‍යයේ විශාල ව්‍යුහාත්මක වෙනසක් සිදුවී තිබේ. සන්නිවේදනාත්මක ප්‍රවේශයට අනුව

1. මාක්ස්, එංගල්ස්. සම්පූර්ණ කෘතීන් වෙළුම 2 පිටුව 461.



අද ලෝකය එද මෙන් නොව ඉතා 'කුඩා ගම්මානයක්' බවට පත්වී තිබේ. ලෝකය පුරා විහිදී ගොස් ඇති ඉතා බලසම්පන්න ජනසන්නිවේදන මාධ්‍ය පද්ධතිය මගින් සමස්ත 'ශිෂ්ටාචාරයේ විඥනය', 'ලෝක විඥනය' කෙරෙහි දැඩි බලපෑමක් ඇති කරයි.

අන් සියල්ලටම වඩා මිනිසාගේ විඥනයට බලපාන්නේ ජනසන්නිවේදනයයි. ජන්සන්නිවේදනය මගින් සමාජ විඥනය හැඩ ගස්වනවා පමණක් නොව එය නිර්මාණය ද කරන්නේය. වර්තමාන ජනසන්නිවේදනයෙන් තොරව සමාජ විඥනය පිළිබඳව අපට කල්පනා කළ නොහැකි තරමටම සමාජ විඥනය හා ජනසන්නිවේදනය අතර ඉතා ගැඹුරු මෙන්ම සංකීර්ණ සම්බන්ධතාවක් පවතී.

සමාජ විඥනය හා ජනසන්නිවේදනය අතර පවතින ගැඹුරු හා සංකීර්ණ සම්බන්ධතාව අද බොහෝ චින්තකයන් හා මාධ්‍යවේදීන් විසින් අධ්‍යයනය කරනු ලබන්නේ එය ඒ තරමටම වර්තමාන මිනිසාගේ පැවැත්මට හා වර්ධනයට ඉවහල් වන බැවිනි. සන්නිවේදනය හා සමාජ විඥනය අතර වර්තමානයේදී දක්නට ලැබෙන විවිධ ප්‍රවණතාවන් සහ මේ දෙක අතර පවතින තියුණු සම්බන්ධතාව සැලකිල්ලට ගත් විට පෙනී යන්නේ අනාගත මිනිසාගේ පැවැත්ම හා වර්ධනයේ මූලික ස්වරූපය මේ දෙක හා සම්බන්ධ ස්වරූපයක් විය හැකි බවයි.

මිනිස් විඥනය ස්වභාවයෙන්ම ක්‍රියාශීලිය, නිර්මාණාත්මකය. මිනිස් විඥනයේ ස්වභාවය වටහාගත් ලෙනින් මෙසේ ලිවීය. "මිනිසාගේ විඥනය විෂය මූලික ලෝකය පරාවර්තනය කරනවා පමණක් නොව එය නිර්මාණය ද කරන්නේය:[1] නමුත් මිනිස් විඥනයට ලෝකය නිර්මාණය කිරීමේ හැකියාව රඳාපවතින්නේ එයට ජනසන්නිවේදනයේ තිබෙන සම්බන්ධතාව අනුවත් ජනසන්නිවේදනය මගින් සමාජ විඥනය මෙහෙයවනු ලබන නිසාත්ය.

1. ලෙනින් වී. අයි. සම්පූර්ණ කෘතීන්, වෙළුම 18 පිටුව 276

පංති ප්‍රවේශය අනුව 'මිනිස් ඉතිහාසය පංති අතර අරගලයේ ඉතිහාසය'[1] වශයෙන් ගත්කල මිනිස් විඥනයේ ඉතිහාසය යනු එහි පරාවර්තනයේ ඉතිහාසය වශයෙන් ඉදිරිපත් වේ. මේ අනුව පෙනියන්නේ මිනිස් ඉතිහාසයේ යුගයෙන් යුගය සමාජ විඥනය ඒ ඒ යුගයන්හි රාජ්‍ය බලය අත්කර ගෙන සිටි පංතිය මගින් මෙහෙය වූ බවයි. යම් කිසි යුගයක රාජ්‍ය ආධිපත්‍ය දරන්නා වූ සමාජ පංතිය අන් සැමටම කලින් ජනමාධ්‍ය ආයතන කෙරෙහි විශේෂ අවධානය යොමු කරන්නේ එහි පැවැත්ම ඉන් තොරව කරගෙන යා නොහැකි නිසාය. ජනමාධ්‍ය ආයතන ඔවුන් අතට ගැනීම යන්නෙන් අදහස් වන්නේ ජන විඥනය ඔවුන් අතට ගැනීමය. ජනමාධ්‍ය ආයතන ඔවුන්ගේ ආධිපත්‍යයට ගෙන තමන්ගේ පැවැත්මට අවශ්‍ය කරන අදහස්, ආකල්ප, ප්‍රවෘත්ති ආදිය ප්‍රචාරය කොට විශේෂ ජනමතයක් ගොඩ නඟා ක්‍රමානුකූලව ජන විඥනය සිය පැවැත්මට සරිලන පරිදි නිර්මාණය කරයි. මෙලෙස පාලන බලයේ සිටින සමාජ පංතියේ විඥනය සමස්ත පුරවැසි සමාජයේම විඥනය හැටියට ජනසන්නිවේදන මාධ්‍ය හරහා පොදු ජනතාවට 'ඇදවීමට', ආරෝපණය කිරීමට ප්‍රයත්න දරයි. මේ නිසා පොදු ජනතාව සැම විටම වාගේ එම සමාජ පංති විඥනයේ ආධිපත්‍යයට ගොදුරු වී පීඩනයට පත්වී සිටියත් මෙහි බෙදවාචකය නම් ඔවුන්ට මේ පිළිබඳව ස්වයං අවබෝධයක් නොතිබීමයි. මෙය ජනසන්නිවේදනය හා සමාජ විඥනය අතර පවතින ප්‍රධාන දර්ශනික ගැටලුවකි.

වර්තමාන ලෝකයේ විද්‍යාව හා තාක්‍ෂණය වර්ධනය වීමේ ප්‍රතිඵලයක් වශයෙන් ජනසන්නිවේදන මාධ්‍යයන්ගේ ගැඹුරු වෙනස්කම් සිදුවෙමින් පවතී. ප්‍රධාන ප්‍රවණතා දෙකක් මේ ක්‍ෂෙත්‍රයේ දැකිය හැකිය. ජනසන්නිවේදනය ආශ්‍රිත ප්‍රවෘත්ති ක්‍රියාදාමය විමධ්‍යගතවීම ඉන් පළමු වැන්න වන අතර මධ්‍යගතවීම දෙවැන්න වේ. නමුත් මින් ඉතා ප්‍රබල ප්‍රවණතාව වශයෙන් ඉදිරිපත් වන්නේ දෙවැන්න වන ඒකාධිකාරී මධ්‍යගතවීමේ ප්‍රවණතාවයි.

1. මාක්ස්, එංගල්ස් සම්පූර්ණ කෘතීන්, වෙළුම 42 පිටුව 574



පුද්ගලික සන්නිවේදන මාධ්‍ය ක්‍රම, දුරකථනය, කැසට්, වීඩියෝ, කොම්පියුටර්, ටෙලෙක්ස් හා ෆැක්ස් ආදිය නිසා ජනසන්නිවේදනයේ නිදහස් භාවය පුළුල්වී ප්‍රජාතාන්ත්‍රික විමධ්‍යගතවීමේ යථාර්ථවාදී ප්‍රවණතාව පිළිබඳ බොහෝ මාධ්‍යවේදීහු කල්පනා කළහ. නමුත් එය එසේ නොවීය. කැසට්, කොම්පියුටර් හා වීඩියෝ ආදි පුද්ගලික පරිහරන මාධ්‍යයන් නිසා ලෝකයේ බොහෝ ප්‍රදේශවල පාරම්පරික සංස්කෘතීන්ගේ විශාල වෙනසක් වූ අතර ඒ ප්‍රදේශවල උප සංස්කෘතීන් ගොඩනැගෙන්නට විය. මෙය සමාජ විඥනයට ජනසන්නිවේදන මාධ්‍ය ඇති කළ බලපෑමේ ප්‍රතිඵලයකි. නමුත් මේ තත්ත්වය යටතේ සමාජ විඥනයට ඇත්තා වූ රාජ්‍ය ආධිපත්‍යයේ සම්බන්ධතාවයේ සැලකිය යුතු වෙනසක් ඇති නොවුණි. එනම ජනසන්නිවේදන මාධ්‍යයක් පොදුවීම නිසා බොහෝ දෙනා කල්පනා කළ පරිදි ජනසන්නිවේදනයේ නිදහස්, ප්‍රජාතන්ත්‍රවාදී ගුණාත්මක විපර්යාසයක් ඇති නොවුණි. මක්නිසාද යත් ප්‍රවෘත්ති බෙද හැරීමේ, ප්‍රවෘත්ති ලබාගැනීමේ මාධ්‍යයන් පොදු වුවත් ප්‍රවෘත්ති නිෂ්පාදනය, බෙදහැරීම සහ ප්‍රවෘත්තිවල අයිතිය පිළිබඳ ප්‍රශ්නයේ ස්වභාවය ඉන් වෙනසක් නොවූ නිසාය. සිදු වූයේ ප්‍රථම ප්‍රවණතාව අබිබවා දෙවන ප්‍රවණතාව වන ඒකාධිකාරිය මධ්‍යගතවීමයි. ප්‍රවෘත්තිවල අයිතිය, නිෂ්පාදනය හා බෙද හැරීම පදනම් කරගත් ජනසන්නිවේදන මාධ්‍යයේ ඒකාධිකාරී මධ්‍යගතවීමක් සිදු වූ අතර පෙරට වඩා රාජ්‍ය ආධිපත්‍ය ජනසන්නිවේදන මාධ්‍ය මත බලපැවැත්වීමට අවශ්‍ය කරන තාක්ෂණික හා කාර්මික පදනමක්ද නිර්මාණය විය.

"ප්‍රවෘත්ති නිෂ්පාදනය කරන හා බෙද හරින දැවැන්ත මධ්‍යස්ථාන කීපයක් බිහි වූ අතර ඒවා ඉතා නවීන තාක්‍ෂණික කාර්මික පදනමකින් සමන්විත වී තිබේ."[1] ලෝක පරිමාණයේ ප්‍රවෘත්ති හා ප්‍රචාරක කාර්මික සංකීර්ණ බිහිවිය. සියලුම රටවල්වලට අවශ්‍ය කරන ප්‍රවෘත්ති, තොරතුරු මෙවැනි ජාත්‍යන්තර ප්‍රවෘත්ති හා ප්‍රචාරක ඒකාධිකාරී මධ්‍යස්ථාන කිහිපයකින් බෙදහරිනු ලැබේ. අවසාන වශයෙන් මේ

1. දනුම – ශක්තියයි – සඟරාව නො. 11, පිටුව 50, 1938

ජාත්‍යන්තර ප්‍රවෘත්ති හා ප්‍රචාරක ඒකාධිකාරී මධ්‍යස්ථාන වලින් බෙදා හරින ප්‍රවෘත්ති හා තොරතුරු තමන්ගේ ආර්ථික හා දේශපාලන අරමුණු නියෝජනය කරයි. (අතීත මෙන්ම වර්තමාන අමෙරිකානු – ඉරාක යුද්ධය පිළිබඳ ඇමෙරිකාව හා ඉරාකය දෙන ප්‍රවෘත්ති සන්සන්දනය කර බලන්න.) ''සීතල යුද්ධය'' සමයේදී ආර්ථික වර්ධනය හා තාක්‍ෂණය ගැන ඇමෙරිකානු ප්‍රවෘත්තිවල ප්‍රධාන ප්‍රවණතාව වූ අතර සමාජ සාධාරණත්වය හා සාමය සෝවියට් ප්‍රවෘත්තිවල ප්‍රධාන ප්‍රවණතාව විය. ඇමෙරිකාව ගැන කතා කරන විට ආර්ථික වර්ධනය පිළිබඳ පින්තූරයක්ද සෝවියට් දේශය පිළිබඳ කතා කරන විට සමාජසාධාරණත්වය පිළිබඳ පින්තූරයක්ද අප විඥනයෙහි ඇති වන්නේ මේ නිසාය.

එක් රටක් වශයෙන් ගත්තද සියලුම ප්‍රධාන ජනසන්නිවේදන මාධ්‍ය – ආයතන රාජ්‍ය සතුව පවතී. එනම් ඒ වන විට රාජ්‍ය ආධිපත්‍ය දරන්නා වූ සමාජ පංතිය ප්‍රධාන පුවත්පත්, සඟරා, ගුවන්විදුලිය, චිත්‍රපටි, රූපවාහිනිය ආදිය රාජ්‍ය පාලනය යටතේ පවතියි. ජන විඥනය නිර්මාණය කරනු ලබන්නේ මෙම ප්‍රධාන මාර්ගවලිනි.

ජන විඥනයේ නිර්මාපකයෝ කවරහුද? ජන විඥනයේ වාහකයෝ කවරහුද? යන මූලික ගැටලු සමාජ විඥානය හා ජනසන්නිවේදනය අතර තිබෙන දර්ශනික ගැටලු විශ්ලේෂණය කිරීමේදී සැලකිල්ලට ගැනීම වැදගත් වේ.

මෙහිදී පොදු ජනතාව සමාජ විඥානයේ නිර්මාපකයන් වශයෙන් පෙනී ගියද එය එසේ නොවන බව පෙනේ. ''පොදු ජනතාවට සිය මතයක් නොමැත, දෘෂ්ටියක් නොමැත. ඔවුන්ට වියුක්ත න්‍යායික සංකල්ප අවබෝධ කරගත නොහැකිය, ඔවුන් මූලික වශයෙන් ක්‍රියාත්මක වන්නේ බාහිරින් ඔවුන්ට ඇතුළු කරන්නා වූ අදහස්, ප්‍රවෘත්ති හා තොරතුරු මුල් කරගෙනය.''[1] මේ ප්‍රශ්නය සම්බන්ධව වී. අයි. ලෙනින්ද මීට සමාන අදහසක් ප්‍රකාශ කරමින් ''පංතිමය, දේශපාලන විඥානය කම්කරුවන් වෙතට ගෙන

1. ජනතාව සහ අරගලය 1979 පිටුව 81 – 82



ආ හැක්කේ පිටතින් පමණි.'[1] කිසිම ශිෂ්ට සම්පන්න රටක පුවත්පත් කලාවෙන් තොර කිසිම ජනතා ව්‍යාපාරයක් පැන නොනගී.'[2] මෙය තවත් පැහැදිලිව කාල් කෞට්ස්කි මෙසේ සටහන් කරයි. ''සමාජවාදී විඥනය යනු නිර්ධන පංති අරගලයට පිටතින් ඇතුළු කරන ලද්දක් මිස එය අභ්‍යන්තරයෙන් සංසිද්ධික වශයෙන් පැණ නැඟුණ දෙයක් නොවේ.''[3]

මේ අනුව පෙනී යන ප්‍රධාන කාරණාවක් වන්නේ සමාජ විඥනය හෙවත් ජන විඥනය ජනතාව තුළ නිතැතින්ම ජනිත වන්නක් නොව එය ඔවුන්ට පිටතින් ආරෝපණය කළ යුතු බවයි. ඒ අනුව සමාජ විඥනයේ නිර්මාපකයන් පොදු ජනතාව නොවන බව පැහැදිලි වේ. ඒ එසේ නම් එහි නිර්මාපකයෝ කවරහුද? ජන විඥනයේ නිර්මාපකයන් වශයෙන් ඉදිරිපත් වන්නේ බුද්ධිමතුන් හා උගතුන්ය. නිදර්ශනයක් වශයෙන් වර්තමාන සමාජ විඥනයේ එක් ස්වරූපයක් වන සමාජවාදී නිර්මාපකයන් වූයේ දර්ශනිකයන් හා ආර්ථික විද්‍යාඥයන්ය. දේපල හිමි පංතිවලට අයත් උගතුන් හා බුද්ධිමතුන් විසින් පැහැදිලි කරන ලද දර්ශනවාදී, ඓතිහාසික, හා ආර්ථික න්‍යායයන් තුළින් සමාජවාදී න්‍යායය ජනිත විය. නවීන විද්‍යාත්මක සමාජ විඥනයේ නිර්මාතෘවරයන් වූ මාක්ස් හා එංගල්ස් ද සමාජ තත්ත්වය අනුව ධනේශ්වර බුද්ධිමත් ගණයට අයත් වූහ. ඒ ලෙසම රුසියාවේද සමාජප්‍රජාතන්ත්‍රවාදී න්‍යායික ධර්මය කම්කරු පංතියේ සංසිද්ධික වර්ධනයෙන් සම්පූර්ණයෙන්ම නිදහස්ව පැන නැංගේය. එය පැන නැංගේ විප්ලවවාදී – සමාජවාදී බුද්ධිමතුන් අතර චින්තනය දියුණු වීමේ ස්වභාවික හා අනිවාර්ය ප්‍රතිඵලයක් වශයෙනි.''[4]

සමාජ විඥනයේ වාහකයන් වශයෙන් ක්‍රියා කරන්නේ ජනසන්නිවේදන මාධ්‍යයි. මිනිසාගේ පැවැත්ම සඳහා

1. ලෙනින් වි. අයි. සම්පූර්ණ කෘතීන්, වෙළුම 5 පිටුව 26
2. ලෙනින් වි. අයි. සම්පූර්ණ කෘතීන්, 5 පිටුව 37
3. කාල් කොට්ස්කි Neue Zeit වෙළුම 1901 – 1902, xx, අංක 3, පි. අ. 79
4. ලෙනින් වී. අයි. සම්පූර්ණ කෘතීන්, වෙළුම 5, පිටු 99

කොතෙක් දුරට සිය මධ්‍යම ස්නායු පද්ධතිය අවශ්‍ය වන්නේද ඒ තරමටම සමාජ විඥානයේ පැවැත්ම සඳහා ජනසන්නිවේදන මාධ්‍ය අවශ්‍ය වේ. සමාජ ජීවිතයේ ස්නායු පද්ධතිය ජනසන්නිවේදන මාධ්‍යයි.

උගතුන් හා බුද්ධිමතුන් විසින් නිර්මාණය කෙරෙන බුද්ධිමය හා ආධ්‍යාත්මික ක්‍රියාකාරිත්වයේ ප්‍රතිඵල පොදු ජනතාව වෙතට ගෙන යායුතුය. එය සිදුකරනුයේ ජනසන්නිවේදන මාධ්‍ය ක්‍රියාදාමය තුළ කටයුතු කරන මාධ්‍යවේදීන් විසිනි. මේ අනුව ඕනෑම සමාජයක ජීවත්වන 'විශේෂ සීමිත කණ්ඩායමක්' විසින් නිර්මාණය කෙරෙන බුද්ධිමය හා අධ්‍යාත්මික අගය තවත් 'විශේෂ කණ්ඩායමක්' මාධ්‍යවේදීන් විසින් පොදු ජනතාව වෙතට ගෙනයනු ලැබේ. විවිධ සංස්කෘතික මට්ටම්වල ජීවත්වන පොදු ජනතාව ඒවා විවිධාකාරයට උරාගනී. යම්කිසි සමාජ සිදුවීමක් පිළිබඳව විශේෂඥයකු ඉදිරිපත් කරන නිශ්චිත අදහසක් ප්‍රවෘත්තියක් මාධ්‍යවේදීන් විසින් පොදු ජනතාව වෙතට ගෙන ගිය පසු එම එකම ප්‍රවෘත්තිය පොදු ජනතාව ඒකමාකාරයකට නොව විවිධාකාරයට අවබෝධ කරගෙන ක්‍රියාත්මකවේ. මෙයද ජන විඥානය හා ජනසන්නිවේදනය අතර පවතින සංකීර්ණ ගැටලුවකි.

රාජ්‍ය බලය දරන්නා වූ පංතියේ අදහස්, ආකල්ප හා දෘෂ්ටිය ජනසන්නිවේදන මාධ්‍ය හරහා සමස්ත සමාජයේම දෘෂ්ටිය වශයෙන් ප්‍රචාරය කරහැරීම නිසා පුරවැසි සමාජයෙහි නිල හා නිල නොවන ජනමතයක් දක්නට ලැබේ. මේ නිසා ජනමාධ්‍යයේ ප්‍රධාන කාර්යයක් වන සමාජ යථාර්ථය පරාවර්තනය කිරීම පස්සට තල්ලු වී පාලක පංතියේ දෘෂ්ටිය ඉදිරියට පැමිණේ. නමුත් සැබෑ මාධ්‍ය වේදියා 'සිද්ධීන්ගේ සැබෑ තත්ත්වය හෙළිකළ යුතුය.'[1] මේ අනුව මාධ්‍යවේදියා පොදු ජනතාව වෙතට යථාර්ථවාදී අදහස් ගෙන යන්නෙකු වශයෙන් පමණක් නොව ඒවා නිර්මාණය කරන්නකු වශයෙන්ද ක්‍රියාකළ හැකිය. මේ අනුව ජනසන්නිවේදන-

1. මාක්ස්, එංගල්ස්, සම්පූර්ණ කෘතීන්, වෙළුම 1, පිටුව 181.



වේදීන්, දර්ශනිකයන්, ලේඛකයන්, කලාකරුවන්, ආදී විශේෂ මිනිසුන් කණ්ඩායමක් ඕනෑම සමාජයක ජන විඥානය නිර්මාණය කරන්නන් වශයෙන් ඉදිරිපත් වේ.

නමුත් වර්තමාන ප්‍රචාරක ධනවාදී සමාජයේ ජීවත්වන පොදු ජනතා විඥානය පොදු ජනතාවගෙන් පරාරෝපණය වී තිබේ. මෙකී සමාජයේ ජනසන්නිවේදන මාධ්‍ය මිනිස් විඥානය කෙරෙහි අති විශාල බලපෑමක් ඇති කරනු ලැබේ. මෙම සිදු කරන නිරන්තර බලපෑමේ ගුණාත්මක ස්වරූපය වර්ධනය වන්නේ, එක් අතකින් විද්‍යාවේ හා තාක්ෂණයේ ප්‍රගතිය හේතු කොට ගෙන සන්නිවේදන මාධ්‍යයන්ගේ තියුණු වර්ධනයට උපකාරී වන තාක්ෂණික පදනමක් නිර්මාණයවීම නිසා වන අතර, අනෙක් අතින්, සමාජ විද්‍යාවේ හා මනෝවිද්‍යාවේ නව වර්ධනයක් පදනම් කරගෙන මිනිස් විඥානයේ හා සමාජ විඥානයේ ස්වභාවය වටහාගෙන එය කුමන ආකාරයට පාලනය කළයුතු ද යන්න අවබෝධ කරගැනීමයි. මේ අතර ලෝක ප්‍රවෘත්ති හා ප්‍රචාරක සංකීර්ණය ක්‍රමානුකූලව පුළුල් වන්නේය. "වර්තමාන ලෝක ප්‍රවෘත්ති සාගරය මිනිසාට නිසි මාර්ගයේ පිහිනීමට නොහැකි වන අන්දමට සංකීර්ණය."[1]

පුවත්පත්, සහරා හා ගුවන්විදුලියට වඩා සමාජ විඥානය හැඩ ගැස්වීමෙලා දැඩි බලපෑමක් රූපවාහිනිය මගින් ඇති කරනු ලැබේ. වර්තමාන රූපවාහිනිය කොතෙක් දුරට මිනිසාගේ විඥානයට බලපාන්නේදැයි කිවහොත් රූපවාහිනිය මගින් වර්තමාන මිනිසාගේ හැඟීම්, ආකල්ප, චින්තනය පමණක් නොව ඔහුගේ හැසිරීම, ක්‍රියාකාරිත්වය පවා වෙනස් කෙරෙයි. වර්තමානයේ බොහෝ මිනිසුන් කල්පනා කරන්නේ රූපවාහිනිය හරහාය. මේ තත්ත්වය හමුවේ සමාජ විඥානයෙහි වැදගත් සම්භාව්‍ය ස්වරූපය වන ආගම, දර්ශනය කලාව, ආචාර ධර්ම ආදිය තියුණු අභියෝගයකට ලක්වී තිබේ.

1. සාසුස්කි ය. නි. ධනපති සමාජයෙහි පුවත්පත් කලාව 1976, පිටුව 172.

පොදු ජනතාවගේ විඥනයෙහි වූ විමර්ශනශීලීභාවය හා විශ්ලේෂණාත්මකභාවය නැතිවී ගොස් පරාධීන හා උදාසීන භාවයක් දක්නට ලැබේ.

වර්තමාන මිනිසා මූලික වශයෙන් සන්නිවේදනාත්මක ස්වරූපයක් පෙන්නුම් කරයි. ''සන්නිවේදනීක මිනිසා'' යනු වර්තමාන සන්නිවේදන සංස්කෘතියේ ප්‍රතිඵලයකි. මිනිසා ලබා ගන්නා ප්‍රවෘත්ති මත ඔහු ඔහුගේ කටයුතු යොමු කරයි. ප්‍රවෘත්ති එහි ක්‍රියාදාමයක් වන අතර මිනිසා තමන්ට අවශ්‍ය ප්‍රවෘත්ති දැනගත් පසු ඔහුගේ පෞද්ගලික හා සමාජීය ක්‍රියාකාරිත්වය කෙරෙහි ඔහු නැඹුරු වේ. හැඟීම් සමඟ මිනිසා බාහිර ලෝකයේ ප්‍රවෘත්ති ලබාගන්නා අතර ඉන්පසු ඔහුගේ සමාජීය ක්‍රියාකාරිත්වයේ නැඹුරුව සිදුවේ. මෙය සන්නිවේදනාත්මක සංස්කෘතියේ පොදු ලක්ෂණයයි.

මිනිස් ශිෂ්ටාචාරයෙහි සංවර්ධනයේ පොදු දෘෂ්ටි කෝණයට අනුව සන්නිවේදනය හා ජන විඥනය අතර තිබෙන සම්බන්ධතාව විශ්ලේෂණය කිරීමේදී පෙනීයන කරුණක් වන්නේ මිනිස් සමාජයේ ප්‍රාථමික අවදිවල දී මිථ්‍යාමතවාදය මුල්කරගෙන සන්නිවේදනය හරහා සංස්කෘතිය හැඩගැසුණු අතර ඊට පසුකාලීනව සම්භාව්‍ය ලෝක ආගම් මුල් කරගෙන සන්නිවේදන මාධ්‍ය හරහා ආගමික සංස්කෘතීන් ගොඩනැගුණු අතර වර්තමානයේදී 'ජනසන්නිවේදනය' පදනම් කරගෙන ජන-සන්නිවේදන සංස්කෘතියක් හැඩගැසෙමින් පවතින බවය. මෙහිදී ජනසන්නිවේදනය පොදු ජන විඥන දෘෂ්ටි කෝණයට අනුව 'නව ලෝක ආගමක' ස්වරූපයක් ගනු ඇත.

වර්තමාන ප්‍රවෘත්ති හා ප්‍රචාරක ක්‍රියාදාමය තුළ ජීවත්වන මිනිසා සිය ක්‍රියා කාරිත්වයේදී තමන් සතුව තිබූ සාපේක්ෂ ස්වාධීනත්වය නැති කරගෙන තිබේ. වර්තමානයේ දී මිනිසා සහ ප්‍රවෘත්ති හා ප්‍රචාරක ක්‍රියාදාමයෙන් පරාරෝපණය වී සිටියි. මිනිසා සිය සාමාන්‍ය හැඟීම්, අදහස් හා ආකල්ප පමණක් නොව සිය චින්තන හැකියාව මෙන්ම බුද්ධිමය විශ්ලේෂණාත්මක හැකියාවද වත්මන් ජනසන්නිවේදන ප්‍රවාහය තුළ අහිමිකර ගෙන සිටියි. වත්මන් ජනසන්නිවේදන ක්‍රියා



දාමය මිනිස් විඥනයට කරන නිරන්තර වූද ගැඹුරු වූද සංකීර්ණ වූද බලපෑම් නිසා මිනිසාගේ විඥානයෙහි විවිධ මට්ටම්වල තිබූ සිය පැවැත්ම හා වර්ධනය සඳහා වැදගත් වන්නා වූ සමහර ගුණාංගයන්ගෙන් මිනිසා පරාරෝපණය වී සිටියි.

මිනිසා වටාවූ ප්‍රකෘති ආධ්‍යාත්මික හා සංස්කෘතික පරිසරය නැති වී ගොස් ඔහු වටා කෘත්‍රිම හා යාන්ත්‍රික පරිසරයක් වත්මන් ජනසන්නිවේදන මාධ්‍ය මගින් නිර්මාණය කර තිබේ. මෙය මූලික වශයෙන් මිනිස් විඥානයට වත්මන් ජනසන්නි-වේදන මාධ්‍ය ඇතිකරනු ලබන දැඩි බලපෑමේ ප්‍රතිඵලයකි.

වර්තමාන මිනිසා ප්‍රවෘත්ති හා ප්‍රචාරක ලෝකයෙහි පරාධීනව සිටියි. මුළු සමාජ විඥානයම ප්‍රධාන ප්‍රවෘත්ති හා ප්‍රචාරක මධ්‍යස්ථාන කිහිපයකින් මෙහෙයවීම නිසා මිනිසාගේ සමාජ ක්‍රියාකාරිත්වය ඉතා දැඩි ලෙස පාලනයකට ලක්වී තිබේ. ඉන් මිදීමට මිනිසාට නොහැකිය. මෙය ජනසන්නිවේදනයේ සහ ජන විඥානය ක්ෂේත්‍රයේ සැලකිය යුතු දර්ශනික ගැටලුවකි. මිනිසා අන් අය විසින් ඔවුන්ගේ උවමනාවන්වලට හා අරමුණුවලට සරිලන ආකාරයේ ප්‍රවෘත්ති සාද නිමකර ජනසන්නිවේදන මාධ්‍ය හරහා ලබාගෙන ඒ අනුව ඔහුගේ පෞද්ගලික හා සමාජීය ක්‍රියාකාරිත්වය මෙහෙයවනු ලැබේ. ඒ අනුව වර්තමාන මිනිසාගේ හැසිරීම තීරණය වනු ලබන්නේ ඔහු විසින් ලබාගන්නා ප්‍රවෘත්ති මත නොව අන් අය විසින් සද නිම කර ජනසන්නිවේදන මාධ්‍ය මගින් ලබා ගන්නා ප්‍රවෘත්ති මතය. මෙම ගැටලුව මිනිස් සමාජය ආරම්භයේ සිටම තිබුණ නමුත් අද එය ඉතා සංකීර්ණ ගැටලුවක් බවට පත්ව තිබේ. මිනිසා ප්‍රවෘත්ති වලින් පරාරෝපණය වී සිටීම ජයගත නොහැකි ගැටලුවක් නොවන බව පැහැදිලි වන්නේ සමජ සංවිධානයන්ගේ වර්ධනයේ ඓතිහාසික දෘෂ්ටිකෝණයට අනුවය. ''මේ සඳහා අවශ්‍ය වන්නේ සමාජ සංවිධාන රටාවේ ගැඹුරු වෙනසක් සහ විද්‍යා – තාක්ෂණයේ ප්‍රගතිය පමණි.''[1]

---

1. අගර්කොව් ඒ. පි. – දැනුම හා සන්නිවේදනය සහරාව–දර්ශනික ප්‍රශ්න – No. 7, 1989 පිටුව 09.

මිනිස් විඥානයේ මූලික කාර්ය වශයෙන් ඉදිරිපත් වන්නේ විවිධ අවස්ථාවන්හි මිනිසාගේ හැසිරීම නිසියාකාර කිරීම හා සංවිධානය කිරීමයි. ඕනෑම මිනිසකුට නිශ්චිත සංස්කෘතික මට්ටමක් තිබෙන නිසා සතුන්ට වඩා හැසිරීමේ හා නිසියාකාරභාවයේ ගුණාත්මක ලක්ෂණ අනුව උසස් ස්වරූපයක් දක්නට ලැබේ. නමුත් මෙය සංස්කෘතියෙන් සංස්කෘතියට වෙනස් වන අතර වර්තමානයේ මෙම වෙනස ටිකෙන් ටික අඩු වෙමින් පවතියි. වර්තමාන ජනසන්නිවේදන මාධ්‍ය ප්‍රබල බලපෑමක් ජනවිඥානයට ඇති කරන අතර ජනවිඥානයෙහි ඇත්තා වූ ඒ ඒ ජාතික සංස්කෘතීන්ට අදාළ යම් යම් ආධ්‍යාත්මික අගයන් වේගයෙන් හීන වී යමින් පොදු සාම්ප්‍රදයික නොවන සංස්කෘතියක් හැඩගැසෙමින් පවතී.